# 11 ශ්‍රේණිය - සිංහල සාහිත්‍යය රසාස්වාදය (පිළිතුරු)

01. ප්‍රශ්නය

(I) අ - කුස කුමාරයා/ ඔක්කාක රජුගේ, සීලවති බිසවගේ වැඩිමල් පුත්‍රයා/ ජයම්පති කුමරුගේ සහෝදරයා

ආ - කම්මිත්තකට/ සේවිකාවකට

(II) අ - වෙසක් කූඩුව ගිනි ඇවිලී අත පිළිස්සීම/ අත පිළිස්සීම

ආ - ජී.බී.සේනානායක මහතා

(III) අ - නරක කාලයට සත්ත්වයන් හට විපත් පැමිණේ.කළ පව් ගෙවා මිස ඒවා දුරු නොවේ.

ආ - සුභාෂිතය/ සුභාෂිත උපදේශ කාව්‍ය

(IV) අ - සුද්ධෝදන රජු/ සුදොවුන් රජු

ආ - බුදුන් වහන්සේට

(V) අ - අනුප්‍රාසාලංකාරය

ආ - සාගර පලන්සූරිය මහතා

02. ප්‍රශ්නය

(I) - මන්දිර පර්වතයෙන් අළලන ලද මහා සමුද්‍රය පරිද්දෙන්

- කැටක් ගැසූ කපුටු රැසක් පලවන පරිද්දෙන්

(II) කුස රජු තමාගේ සිංහ නාදයට සමාන හඬින් පමණක් සතුරු සේනාව මර්දනය කොට ප්‍රභාවතියගේ අත ගැනීමට පැමිණි සත් රජවරු පණ පිටින් අල්ලා...

(III) "බෝධිසත්ත්ව වූ කුස රාජෝත්තමයා පරහිංසාවක් නොකොට සිංහ නාද පමණකින් කැටක් ගැසූ කපුටු රැසක් පලවන පරිද්දෙන්..."

කිසිවෙකුට කරදරයක් නොවන පරිදි සත් රජවරුන් මර්දනය කරනු දැක ප්‍රීතියට පත්ව මේ උතුම් පුරුෂයාගේ විරූපිභාවය දුරු කොට උතුම් රූප සෞන්දර්යයෙන් සරසන්නට උවමනා යැයි සිතූ හෙයින්

(IV) දීප්තිමත්ව විරෝචන නම් වූ අෂ්ටවංක මාණික්‍යය සතුටින් කරන ප්‍රදානයක් මෙන් ගෙන කුස රජුගේ පැළඳ වීම.

නැතහොත්,

(I) පිටත්තර/ අයුත්තකට/ අහුමුළුවල රිංගන්ට/ කතත් කමක් නැහැ

(II) - අතක් පයක් ඔලුවක්

- අපේ රට අපේ ජාතිය අපේ ගම

- සොලොවා මරා වළලන්නට

- ගම්මුන් සැවොම ගම්මුන්ටම

(III) - බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

- වදින්නේ නැතිව ලොකු නිලධාරින්ට

- නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

- අයුත්තකට අත්දෙක ඔසවන්ට එපා

ආදි නිදසුන් සමඟින් පිළිතුර කෙටියෙන් පහදා තිබිය යුතුය.

(IV) - සරල ග්‍රාමීය භාෂා භාවිතය

- උද්වේගකර අදහස් ප්‍රකාශනය (විධි ක්‍රියා භාවිතය - අඬ ගසව්, ඉතින් යමව් ආදි)

- අනුප්‍රාසාත්මක යෙදුම් භාවිතය (උදා - අතක් පයක් ඔලුවක්, අපේ රට අපේ ජාතිය අපේ ගම)

- සමාජ අවශ්‍යතාවය කුළු ගැන්වීම (උදා - අයුත්තකට අත්දෙක ඔසවන්ට එපා, වදින්නේ නැතිව ලොකු නිලධාරින්ට)